මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DFD/pawning loans/2024
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.07.31

චක්‍රලේඛ අංකය : DFD/ 2024- 2

සමානාධිකාරී, ලංකා බැංකුව
සමානාධිකාරී, මහජන බැංකුව
සමානාධිකාරී, ජාතික ඉතිරිකිරීමේ බැංකුව
සමානාධිකාරී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
සමානාධිකාරී, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, අමානා බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, කොමර්ෂල් බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, ඩීඑෆ්සීසී බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, හැටන් නැෂනල් බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, ජාතික සංවර්ධන බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, නේෂන් ට්‍රස්ට් බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, පෑන් ඒෂියා බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, සම්පත් බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, සණස සංවර්ධන බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, සෙලාන් බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී, යූනියන් බැංකුව

මහත්මයාණෙනි/මහත්මියනි,

## බලපත්‍රලාභී බැංකුවල රන් භාණ්ඩ උකස් කළ ජනතාවට සහන සැලසීම

බැංකුවල රන් භාණ්ඩ උකස් කළ ජනතාවට සහන සැලසීම යන මැයෙන් වූ 2024.07.22 දිනැති අංක 24/1433/604/158 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ 2024.07.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා බැඳේ. ඒ අනුව, අස්වැසුම ප්‍රතිලාභීන් විසින් බලපත්‍රලාභී බැංකුවලින් ලබාගන්නා ලද උකස් අත්තිකාරම් සඳහා පොලී සහනාධාරයක් ලබාදීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත. ඒ අනුව, 2024 අගෝස්තු 01 දින සිට බල පැවැත්වෙන පරිදි පහත සඳහන් මෙහෙයුම් මාර්ගෝපදේශවලට අනුකූලව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙස අදාල බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් දෙනු ලැබේ.

1. සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන් සහ උකස් අත්තිකාරම්

   1.1 මෙම වැඩසටහන සඳහා සුදුසුකම් ලබන්නේ අස්වැසුම ප්‍රතිලාභීන් පමණි. ඒ අනුව, ගනුදෙනුකරු අස්වැසුම ප්‍රතිලාභී පවුලක සමාජිකයකු විය යුතුය.

1.2 බලපත්‍රලාභී බැංකු (බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු යන දෙවර්ගයම) මඟින් ගනුදෙනුකරුවන් විසින් තනි පුද්ගල පදනම මත ලබාගෙන ඇති රු.100,000 නොඉක්මවන උකස් අත්තිකාරම් සඳහා පොලී සහනාධාරයක් මහා භාණ්ඩාගාරය විසින් ගෙවනු ඇත.

1.3 ගනුදෙනුකරුවෙකුට මෙම ප්‍රතිලාභය ලබා ගත හැක්කේ එක් බලපත්‍රලාභී බැංකුවකින් පමණක් වන අතර උපරිම උකස් අත්තිකාරම් මුදල් ප්‍රමාණය රු. 100,000ක් පමණි. ඒ අනුව, එකම බැංකුවෙන් ලබාගන්නා ලද උකස් අත්තිකාරම් ප්‍රමාණය නොසලකා මුළු උකස් අත්තිකාරම් මුදල රු.100,000 ක උපරිමයක් දක්වා ගනුදෙනුකරුවෙකුට මෙම සහනය ලබාගත හැකිය.

1.4 2024 ජුනි 30 හෝ ඊට පෙර බලපත්‍රලාභී බැංකු මඟින් ලබාගත් උකස් අත්තිකාරම් පමණක් මෙම වැඩසටහන මඟින් සලකා බලනු ලබයි.

1.5 2024 ජුනි 30 දිනට සක්‍රීය ගණයේ වූ (Performing Category) උකස් අත්තිකාරම් පමණක් මෙම වැඩසටහනට සුදුසුකම් ලබයි.

1.6 ඒ අනුව, 2024 ජුනි 30 දිනට අක්‍රීය ගණයේ පැවති (Non-Performing Category) උකස් අත්තිකාරම් මෙම වැඩසටහන සඳහා සුදුසුකම් නොලබයි.

1.7 ඉහත 1.5 හි සඳහන් සක්‍රීය ගණයේ වූ උකස් අත්තිකාරමක් කල් පිරීමෙන් පසුව ගනුදෙනුකරු විසින් නැවත අලුත් කරන්නේ නම්, එක් අලුත් කිරීමේ වාරයක් පමණක් මෙම වැඩසටහන සඳහා සුදුසුකම් ලබයි. කෙසේ හෝ, අලුත් උකස් අත්තිකාරමෙහි වටිනාකම පෙර උකස් අත්තිකාරමේ වටිනාකමට වඩා අඩු හෝ සමාන නම් පමණක් මෙම සහනය ලැබේ.

2. **අදාල පොලී සහනාධාරය සහ කාලය**

2.1 වාර්ෂිකව 10% ක උපරිමයකට යටත්ව පොලී සහනාධාරයක් මහා භාණ්ඩාගාරය විසින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හරහා අදාළ බැංකු වෙත ගෙවනු ලබයි.

2.2 ඒ අනුව, අදාල බැංකු පොලී අනුපාතය වසරකට 10% කට වඩා වැඩිනම් වාර්ෂික පොලී සහනාධාරය 10% කි. ඒ අනුව, අදාළ බැංකු පොලී අනුපාතය සහ පොලී සහනාධාරය අතර වෙනස ගනුදෙනුකරුවන් විසින් ගෙවිය යුතුය.

2.3 අදාල බැංකු පොලී අනුපාතය වසරකට 10% කට වඩා අඩුනම් හෝ සමාන නම් පොලී සහනාධාරය අදාල බැංකු පොලී අනුපාතයට සමාන වේ.

2.4 ගනුදෙනුකරුවකු පහත පරිදි කිසියම් කාල සීමාවක් සඳහා ඔහු විසින් ගෙවිය යුතු අදාල පොලී ප්‍රමාණය ගෙවීමෙන් පසුව පමණක් මහා භාණ්ඩාගාරය විසින් එම කාලයට අදාල පොලී සහනාධාරය ගෙවනු ලැබේ.

- ගනුදෙනුකරු විසින් උකස් අත්තිකාරමෙහි සම්පූර්ණ ගිවිසුම්ගත කාලයට අදාලව ඔහු/ඇය විසින් ගෙවිය යුතු පොලිය (2.2 හා 2.3 හි සඳහන් පරිදි) පියවීමෙන් පසුව
- ගනුදෙනුකරු විසින් උකස් අත්තිකාරමෙහි ගිවිසුම්ගත කාලයෙන් කොටසකට අදාලව ඔහු/ඇය විසින් ගෙවිය යුතු පොලිය(2.2 හා 2.3 හි සඳහන් පරිදි) පියවීමෙන් පසුව

2.5 මෙම පොලී සහනාධාරය ලබා දෙන්නේ 2024 අගෝස්තු 01 සිට 2026 ජූලි 31 දක්වා උපරිම වශයෙන් වසර 2 ක කාලයක් සඳහා පමණි. ඒ අනුව, 2024

අගෝස්තු 01 දිනට පෙර කාල සීමාව හා 2026 ජුලි 31 දිනට පසු කාල සීමාව සඳහා පොලී සහනාධාරය ලබා නොදේ.

3. **පොලී සහනාධාර ඉල්ලුම් කිරීම**

3.1 පොලී සහනාධාර හිමිකම් ඉල්ලුම්පත් (ඇමුණුම 01), බැංකු විසින් මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත මාසිකව ඉදිරිපත් කළ යුතුය.

3.2 මෙම පොලී සහනාධාර හිමිකම් ඉල්ලුම්පත් අදාළ බැංකුවල අභ්‍යන්තර විගණක විසින් සහතික කල යුතුය.

4. **ගනුදෙනුකරුවන් ලියාපදිංචිකිරීම**

4.1 මෙම සහන වැඩසටහන සම්බන්ධයෙන් බැංකුව විසින් ඉහත 1.2 හි සඳහන් කොන්දේසිය සපුරන සියලුම ගනුදෙනුකරුවන් පුද්ගලිකව දැනුවත් කළ යුතුය.

4.2 එක් එක් ගනුදෙනුකරු තමන් අස්වැසුම ප්‍රතිලාභ ලබන පවුලක සාමාජිකයෙකු බව සඳහන් කරමින් අදාල ප්‍රාදේශීය ලේකම් හරහා තහවුරු කිරීමේ ලිපියක් (අමුණුම 2 ) බැංකුවට ඉදිරිපත් කළ යුතුය.

4.3 මෙම සහනාධාර වැඩසටහන සඳහා ඔහු/ඇය විසින් අනෙකුත් බැංකුවලින් අයදුම්කර නොමැති බව තහවුරු කරමින් දිවුරුම් ප්‍රකාශයක් අයදුම්කරුගෙන් ලබා ගත යුතුය.

5. **අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම**

5.1 2024 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත කරුණු මත පදනම් වූ අභ්‍යන්තර චක්‍රලේඛයක් බැංකුවේ සියලුම ශාඛා වෙත ලැබීමට සැලැස්විය යුතුය.

මේ සම්බන්ධයෙන් ඔබගේ සහයෝගය ඉතා අගය කොට සලකමි.

මෙයට විශ්වාසී,

අත්/කලේ :
කේ.එම්.මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම් - කරු.දැ.ගැ.ස.
2. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ. සහ අ.ක.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ. සහ අ.ක.ස.
4. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ. සහ අ.ක.ස.
5. අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහා බැංකුව - කරු.දැ.ගැ.සහ අ.ක.ස

ඇමුණුම - 1

# බලපත්‍රලාභී බැංකුවල රන් භාණ්ඩ උකස් කල ගනුදෙනුකරුවන්ට පොලී සහනාධාර ලබා දීම

## පොලී සහනාධාර ඉල්ලුම් පත්‍රය

බැංකුවේ නම :

වර්ෂය :

මාසය :

| මෙම මාසය තුලදී සුදුසුකම්ලද මුළු උකස් අත්තිකාරම් ගණන | මෙම මාසය තුලදී සුදුසුකම්ලද මුළු ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | මෙම මාසය ඇතුලත ගනුදෙනුකරුවන් ගෙවූ මුළු පොළිය (රුපියල්) | මෙම මාසය සඳහා මුළු පොලී සහනාධාර මුදල (රුපියල්) |
|---|---|---|---|
| | | | |

ඉහත තොරතුරු සියල්ල සත්‍ය සහ නිවැරදි බව සහතික කරමු

................................................
බලයලත් නිළධාරියාගේ අත්සන

..............................................
බලයලත් නිළධාරියාගේ නම

...........................
දිනය

නිලමුද්‍රාව

..................................................
අභ්‍යන්තර විගණකගේ අත්සන

............................................
අභ්‍යන්තර විගණකගේ නම

................................
දිනය

නිලමුද්‍රාව

ඇමුණුම - 2

(ගනුදෙනුකරුගේ නම සහ ලිපිනය)

.................................................

.................................................

.................................................

2024/......../.........

(බැංකුවේ නම, ශාඛාව සහ ලිපිනය)

කළමණාකරු

......................... බැංකුව

.........................................

.........................................

<u>බලපත්‍ර ලාභී බැංකුවල රන්භාණ්ඩ උකස් කළ ජනතාවට සහන සැලසීම</u>

ඉහත නම සඳහන් මා අස්වැසුම ප්‍රතිලාභ ලබන පවුලක සාමාජිකයෙකු වන බව ප්‍රකාශ කරමි.

ගනුදෙනුකරුගේ සම්පූර්ණ නම: .........................................

ගනුදෙනුකරුගේ ජා.හැ.අ.: ...................................

ගනුදෙනුකරුගේ අත්සන: ....................................

---

(ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සම්පූර්ණ කිරීම සඳහා)

ඉහත නම් සඳහන් ...................................................... මිය / මයා අස්වැසුම ප්‍රතිලාභ ලබන පවුලක සාමාජිකයෙකු බව සහතික කරමි.

ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන:...........................................

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය: .................................................

දිනය: ............................

නිල මුද්‍රාව: